# පුරාතන ඉන්දියානු දේශපාලන න්‍යාය හැඩගැසීම හා කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ දායකත්වය

**- කලුන්දෑවේ චන්දවිමල හිමි**

පුරාතන ඉන්දියානු දේශපාලන න්‍යාය හැඩගැස්වීම සඳහා හින්දු, බෞද්ධ, ජෛන යන ආගමික සම්ප්‍රදායන් ගණනාවක ආභාසය ලැබුණි. මනුධර්ම ශාස්ත්‍රය, කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, භර්තෘහරීගේ නීතිසාරය, බෞද්ධ ත්‍රිපිටක සාහිත්‍යය වැනි න්‍යාය ග්‍රන්ථ සමුදායකින් ඉන්දීය දේශපාලන න්‍යාය හැඩගැස්වී තිබේ. ඉහත දැක් වූ ග්‍රන්ථ අතුරින් කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයට හිමිවනුයේ ඉතා වැදගත් තැනකි. චන්ද්‍රගුප්ත මෞර්ය අධිරාජයාගේ පුරෝහිතයා වශයෙන් කටයුතු කළ චානක්‍ය, විෂ්ණු ගුප්ත හෙවත් කෞටිල්‍යයන් විසින් අර්ථශාස්ත්‍රයේ දී රාජ්‍යය පාලනය සම්බන්ධයෙන් ගොඩ නගා තිබෙන දේශපාලන න්‍යායන් තත්කාලීන මෙන්ම පසුකාලීන ඉන්දීය බොහෝ පාලකයන්ට බලපෑ බවත්, එරට දේශපාලන න්‍යාය සකස්වීම සඳහා මෙම ග්‍රන්ථය හේතු භූත වූ බවත් ඇතැම් විචාරකයන්ගේ මතය වී තිබේ. දේශපාලන බලාධිකාරය යනු රාජ්‍යයක් මෙහෙය වන ප්‍රධාන වාහකයයි. එහි දේශපාලන බලය, විධායක බලය, ව්‍යවස්ථාදායක බලය, අධිකරණ බලය, ආර්ථික බලය හා යුධ බලය යන ප්‍රධාන සංස්ථාවන් යටතේ ගොනුව පවතී. මෙම සංස්ථාවන් රාජ්‍යයත් සමග කෙසේ බද්ධ වී පැවතියේ ද යන්න අධ්‍යයනය කිරීමට ඇති කදිම මූලාශ්‍රය වනුයේ අර්ථශාස්ත්‍රයයි. ඒ අනුව පෙරදිග දේශපාලන න්‍යාය ගොඩනැගී ඇති ආකාරය හා කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ කාර්යභාරය කවරේද යන්න පළමුවෙන් විමසුමකට ලක්කළ යුතුය. කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය

හා පාලකයා අතර ඇති සබඳතාව, ඇමති මණ්ඩලය, චරපුරුෂ සේවය, හමුදාව රාජ්‍ය පරිපාලනය හා සම්බන්ධ වන ආකාරය හා අධිකරණ ක්ෂේත්‍රය, ආර්ථිකය, විදේශ සබඳතා, මිතුරු සබඳතා වැනි ආයතන රාජ්‍යයත් සමග සම්බන්ධ වන ආකාරය කෙසේ ද යන්න විමසුකට ලක්කළ යුතුය. එම කරුණු අධ්‍යයනය කරමින් පුරාතන ඉන්දීය දේශපාලන න්‍යාය සකස්වීමෙහිලා **අර්ථශාස්ත්‍රය** දැක් වූ කාර්යභාරය කවරේද යන්න වීමංශනය කිරීම මෙම ලිපියෙන් අපේක්ෂිතය.

## පෙරදිග දේශපාලන න්‍යාය හා කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය

පෙරදිග දේශපාලන න්‍යාය සකස්වීම සඳහා ආධාර වූ ග්‍රන්ථ අතර **ඍග්වේදයට, මනුධර්ම ශාස්ත්‍රයට, ශුක්‍රගේ නීතිසාරයට,** හා **බෞද්ධ ත්‍රිපිටක සාහිත්‍යයට** වැදගත් තැනක් හිමි වේ. එම ග්‍රන්ථ දක්වන දේශපාලන න්‍යායන්හි ස්වරූපය කවරේද, කෞටිල්‍යගේ දේශපාලන න්‍යාය ඒ අතර වැදගත් වනුයේ කුමක් නිසා ද හා එම න්‍යායන් අනිකුත් න්‍යායන් අතුරින් වෙනස් වනුයේ කෙසේ ද යන්න මෙහි දී විමසුමට ලක් වේ. රාජ්‍ය නමැති දේශපාලන සංස්ථාව මෙහෙයවනු ලබන ප්‍රධාන තැනැත්තා වනුයේ පාලකයා හෙවත් රජුය. ඔහු වටා බලය, අධිකරණය, දඬුවම, ධර්මය ආදි සියල්ල ගොනුව පවතී. ඔහු ධර්මයේ හා නීතියේ ප්‍රතිමූර්තිය වන්නේය. "රජුනි ඔබ රටේ අධිපතියා සේම ස්වාමියා ද වන්න. ස්ථිර නුවණැතිව දැඩි අදහස් හා හොඳ දේ කරන්න. එවිට ඔබේ ප්‍රජාව ඔබ කෙරෙහි කැමැත්ත දක්වති. එයින් රටට අයහපතක් නොවන අතර පාලකයාට පර්වතයක් සේ නොසැළී කටයුතු කළ හැකිය."[1] **ඍග්වේදයේ** එන මේ සඳහනින් රජු පිළිබඳ කරුණු ගණනාවක් හෙළිදරව් වේ. රටේ පාලකයා මෙන්ම රටෙහි ස්වාමියා ද රජු ලෙස මෙයින් අර්ථ ගැන්වේ. එසේම පොළොවේ ආධිපත්‍යය ඔහුට හිමි බව මෙයින් හැඟෙයි. පාලකයා සතුව එඩිතර අවංක ඍජු තීරණ තිබිය යුතු බවත් ගලක් සේ නොසෙල් වී කටයුතු කළ යුතු බවත් එයින් අවධාරිතය. පාලකයා යනු වැනෙන සුළු තීරණ ගන්න අයෙක් නොව, එඩිතර බුද්ධිමත්, ඍජු තීරණ ගැනීමේ හැකියාවක් සහිත අයෙක් බව මෙයින් තහවුරු වේ.



රජු හැම විටම ජනතාවගේ හිත් දිනාගෙන රාජ්‍යය විචාළ යුතුය. රජුගේ ප්‍රධාන කාර්යය වී පැවතුණේ වැරදිකරුවන්ට දඬුවම් දීමයි. අතීත සමාජය දඬුවම සමාජගත කිරීම සඳහා පාලකයකු පත්කර ගත්තේ ය. මේ අදහස හැම න්‍යාය ග්‍රන්ථයකම පාහේ දක්නට ලැබෙන කරුණකි. **දීඝනිකායේ අග්ගඤ්ඤ** සූත්‍රයේ එන සඳහනින් ද පෙනී යනුයේ වංචාව, හොරකම, අවනීතිය රජයන විට මහජනයාම එකතු වී එම දේවල් සමාජයෙන් බැහැර කිරීම සඳහා ඔවුන් අතුරින්ම නිර්භීත, ශක්ති සම්පන්න තැනැත්තෙක් රජෙකු වශයෙන් පත්කරගත් බවය.[2] 'ධර්මයෙන් අන්‍ය ජනයා සතුටට පත් කරන තැනැත්තා රජු නම් වන බව එහිම සඳහන්ය.[3] ජනතා සම්මුතිය මත බිහිවන රජු, මහජනයා ධර්මයෙන් සතුටට පත් කළ යුතුය. බෞද්ධ දර්ශනයට අනුව රජු මහජනයාට සමීප ධාර්මික සේවාවක් සැපයිය යුතුය. පෙරදිග දේශපාලන න්‍යාය සකස්වීමේදී මේ සංකල්පය පාලකයන් කෙරෙහි බෙහෙවින් බලපා තිබේ.

ක්‍රි. පූ. දෙවන සියවසින් පසුව රචිත යැයි විශ්වාස කෙරෙන **මනුධර්ම ශාස්ත්‍රයෙන්** ද තහවුරු වෙනුයේ රජෙක් මෙලොවට නිර්මාණය වනුයේ නීතිය ආරක්ෂා කරලීම සඳහා බවයි. විශ්වයේ ආරක්ෂාව සඳහා බියෙන් පසුවන ජනයා බියෙන් මුදවාලීම සඳහා ඊශ්වරයා විසින් රජු නිර්මාණය කළ බව එහි සඳහන් වේ.[4] සියලු ධර්මයන්ට වඩා රාජධර්මයට මෙහිදී ප්‍රමුඛත්වයක් ලබාදෙන අතර රජුගේ කාර්යය විය යුත්තේ නීතිය ස්ථාපිත කර මහජනයාට සේවය සැලසීමය. එම අපේක්ෂාවන් සපුරාලීම සඳහා දේශපාලන න්‍යායක් **මනුස්මෘතිය** තුළ ගොඩනගා තිබේ. මෙහි එන න්‍යායන් විශේෂයෙන්ම රජු, පුරෝහිත, ඇමති මණ්ඩලය, හමුදාව, ආර්ථිකය වැනි කරුණු හා න්‍යායාත්මක අදහස් **කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයට** බෙහෙවින් සමානය. වෙනසකට ඇත්තේ **මනුස්මෘතිය** තුළ ධර්මය මදක් වැඩි වශයෙන් අන්තර්ගත වීම හා ඉස්මතු කොට දැක්වීම පමණි. ශුක්‍රයන්ගේ **නීතිසාරය** තුළින් ද ගොඩනගන දේශපාලන න්‍යායයන් ද ඉහත න්‍යායන්ට සමානත්වයක් දරයි. රජෙකුගේ පරම ධර්මය විය යුත්තේ ප්‍රජාව පාලනය කිරීම හා දුෂ්ටයන්

විනාශ කිරීමයි. එයින් තොරව රාජ නීතිය ක්‍රියාත්මක කළ නොහැකි බව ඔහුගේ අදහස වී තිබේ.[5] මෙහිදී ද අවධානය යොමු කළ ප්‍රධාන කරුණ වනුයේ 'රාජනීතිය' සමාජගත කිරීමේ න්‍යාය මත, දේශපාලන න්‍යාය ගොඩනගා ඇති බවයි. රාජ්‍යය හා රජු පිළිබඳව මෙන්ම ඉන්දීය දේශපාලන න්‍යායන් සකස් කිරීමේ දී **මහාභාරතයට** වැදගත් තැනක් හිමි වේ. තත් ග්‍රන්ථයට අනුව රජුගේ ප්‍රධාන කර්තව්‍යය විය යුත්තේ ප්‍රජාව සතුටු කිරීම හා සත්‍යය රැකීමයි. එය රජවරුන්ගේ සනාතන දහමකි. රාජධර්මය හා රාජනීතිය ක්‍රියාත්මක කිරීමට පාලකයා වග බලාගත යුතුය.[6] **මහාභාරතය** ගොඩ නගන දේශපාලන න්‍යාය කෞටිල්‍යයට බලපෑවේ ද යන්න හිතෙන තරම් රාජ්‍යය හා බැඳී ඇති න්‍යායන්හි සාම්‍යත්වයක් මේ ග්‍රන්ථ දෙකෙහි දක්නට ලැබේ. වෙනසකට ඇත්තේ රාජ්‍යය සම්බන්ධයෙන් ධාර්මික බවක් ගොඩනගන්නට **මහාභාරතය** උත්සාහ කිරීම පමණි.

ඉහත සඳහන් කරන්නට වූ න්‍යාය ග්‍රන්ථ අතුරින් **කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයට** සුවිශේෂිත්වයක් හිමි වේ. කෞටිල්‍යයන්ට අනුව රජුගේ ප්‍රධාන කර්තව්‍යය විය යුත්තේ දණ්ඩනීතිය ක්‍රියාත්මක කිරීමයි. එතුළින් නොලැබුණු ලාභ ලැබීම, ලැබුණු දෑ රැකීමට ද, රැකුණු දෑ වැඩීම ද සිදු වේ. මුළු ලෝකයම මෙහෙය වනු ලබන්නේ දණ්ඩනීතිය මගින්ය. එය ප්‍රජාව වෙනුවෙන් ද යෙදවිය යුතුය. නැතහොත් මත්ස්‍ය න්‍යාය දක්වන්නාක් මෙන් බලවතා විසින් දුබලයා පෙලීමට ලක්කරයි. එයට රජු කිසිසේත් ඉඩ නොතැබිය යුතුය. එසේ වුවහොත් රාජ්‍යයේ අභ්‍යන්තරය පාලනය කිරීමට හැකි නොවන බව කෞටිල්‍යගේ අදහසයි.[7] මෙවැනි චින්තනයක් ඉදිරිපත් කරන කෞටිල්‍යයන් රාජ්‍ය පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා සුදුසු දක්ෂ හමුදාවක් රාජ්‍ය සතු විය යුතු බවද දක්වයි. රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් ඔහු දක්වන මතවාදයන් අතිශයින්ම වැදගත්ය. මන්ද පුරාතන ඉන්දීය දේශපාලන න්‍යාය සකස් කිරීමේ දී ඔහු ඉදිරිපත් කරනු ලබන කරුණු වැදගත් වන හෙයිනි. **අර්ථශාස්ත්‍රය** රජුගේ සිට ඇමති, චරපුරුෂ, තානාපති සේවය, යුධ කටයුතු, හා ආර්ථිකය බද්ධ කරමින් ගොඩ නගන ලද න්‍යායාත්මක ග්‍රන්ථයකි. ඔහුගේ න්‍යායන් ඉන්දීය දේශපාලන න්‍යාය තුළ වැදගත් වූයේ ද යන්න



මෙහිදී විමංශනය කළ යුතුය. අනිකුත් න්‍යාය ග්‍රන්ථවලට වඩා මේ ග්‍රන්ථය සුවිශේෂිත වනුයේ ධර්මයට වඩා ලෞකිකත්වයට, රාජනීතියට මුල් තැන දෙමින් ආර්ථිකය රාජ්‍යයත් සමග බද්ධ කරමින් රාජ්‍ය මූලධර්ම ගොඩනගා තිබීම නිසාවෙනි.

## කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය හා පාලකයා හඳුනා ගැනීම

කෞටිල්‍යයන් විසින් රචිත **අර්ථශාස්ත්‍රය** තුළින් නිෂ්පත්තිය වූ දේශපාලන න්‍යාය කවරේද යන්න අධ්‍යයනය කරලීමට මත්තෙන් **අර්ථශාස්ත්‍රය** එනමින් හඳුන්වනුයේ කුමක් නිසාද එහි සැකැස්ම හා පාලකයා සම්බන්ධයෙන් ඔහු දක්වන අදහස් කවරේද යන්න අධ්‍යයනය කළ යුතුය. **අර්ථශාස්ත්‍රයත්** එම ග්‍රන්ථයෙන් ගොඩනගන පාලකයාත් හඳුනාගත් කල ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන දේශපාලන න්‍යායන් කවරේද යන්න අවබෝධ කරගත හැකිය. රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් අර්ථකථන දක්වමින්, එයට උපදෙස් සපයමින් රචිත චිරත්තන කෘති ගණනාවක් විශ්ව සාහිත්‍යයෙහි පවතී. එම ග්‍රන්ථ අතුරින් කෞටිල්‍ය නම් වූ සුප්‍රකට භාරතීය ආචාර්යවරයා විසින් සංස්කෘත භාෂාවෙන් සුරචිත **අර්ථශාස්ත්‍රය** නමැති ග්‍රන්ථය සුවිශේෂිත වේ. දේශපාලන විද්‍යාවේ දී අවධානය යොමු කළ යුතු සංකීර්ණ සිද්ධාන්තයේ පටන් සරලම සිද්ධාන්තය දක්වා විවරණය කරමින්, සෛද්ධාන්තිකව සාකච්ඡා කරමින් රචනා කර ඇති මේ කෘතිය අතීතයේ මෙන්ම නූතනයේ ද එසේම අනාගතයේ ද ඕනෑම රාජ්‍යයක රාජ්‍යය පාලන කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය දැනුම ලබා දෙන කෘතියකි. එයින් ඔහුගේ රාජ්‍යතාන්ත්‍රික බව හා දේශපාලන කටයුතු පහසුවෙන් හඳුනා ගැනීමට මග සලසනු ලැබේ.

කෞටිල්‍යයන් විසින් සිය ග්‍රන්ථයට දී ඇති නම වනුයේ **අර්ථශාස්ත්‍රය** යන්නයි. 'අර්ථ' යන්නෙන් ධනය, ධන ලාභය, න්‍යාය, නීතිය යන අරුත් ගැන්වෙන අතර එහි දක්නට ලැබෙන විශේෂත්වය වනුයේ එම අරුත රජු හා රාජ්‍යය පාලනය සම්බන්ධයෙන් ද ඒකාබද්ධ කර තිබීමයි.[8] ශාස්ත්‍ර යන්නෙන් යහපත් උපදේශයන්, විද්‍යාත්මක කෘතිය, ධර්මශාස්ත්‍ර ග්‍රන්ථය,

06 JUN 2014

රජුගේ ධන ලාභය, දිග්විජය, ප්‍රජා පාලනය යන අරුත් ගැබ් වේ.[9] මෙබඳු අර්ථයෙන් '**අර්ථශාස්ත්‍රය**' යන නම මේ සඳහා භාවිත කර ඇති බව පෙනේ. 'අර්ථ' යන්නෙන් හින්දු මතය වනුයේ ධනෝපායනය හා ලෞකික අභිවෘද්ධිය අපේක්ෂා කිරීමයි. අර්ථශාස්ත්‍රය යන නම යෙදීමේ දී ධනෝපායන යන අරුතින් එය යෙදුවද මේ ග්‍රන්ථයේ දී වැඩි අවධානයක් යොමු කර ඇත්තේ දේශපාලන සංස්ථා හා භාවිතය පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමටය. නමුත් එහිදී සුවිශේෂිත සාධකයක් ලෙසින් ආර්ථිකය රාජ්‍යයත් සමග බද්ධ වන අයුරින් ඔහු විසින් න්‍යායත් ගොඩනගා තිබේ. කතුවරයා විසින්ම සිය ග්‍රන්ථයේ නාමය පිළිබඳව විස්තරකථනයක් සිදුකරමින් මිනිසුන්ගේ පැවැත්ම සඳහා හේතු වනුයේ අර්ථ හෙවත් ධනය බවත්, මිනිසුන් ජීවත් වන මේ පෘථිවි ලාභය හා පාලනය ලැබීමේ උපාය ශාස්ත්‍රය 'අර්ථශාස්ත්‍රය'[10] නමින් හඳුන්වන බවත් සඳහන් කර තිබේ. මෙම අර්ථකථනයෙන් ගම්‍යවන ආකාරයට **අර්ථශාස්ත්‍රයේ** ප්‍රධාන අරමුණු දෙකක් වේ. එයින් කියවෙන පළමු කරුණ වන්නේ රාජ්‍යය ආරක්ෂා කර ගැනීම කවරාකාරයෙන් කළ යුතු ද යන්න කියාදීමයි. දෙවැන්න සිය රටෙන් බැහැර දේශයක් දිනා ගැනීම කෙසේ කළ යුතු ද යන්න කියාදීමයි. මීට අමතරව **අර්ථශාස්ත්‍රය** රචනා කිරීම තුළින් පෘථිවිය පාලනය කිරීම පිළිබඳ දැනුමත්, අර්ථ ශාස්ත්‍රය ලැබීමත් අපේක්ෂා කරන බව කතුවරයා විසින් කියා තිබේ.[11] අල්ටේකාර්ගේ මතය වනුයේ **අර්ථශාස්ත්‍රයෙන්** ප්‍රදේශයක් අත්පත්කර ගැනීම හා ආරක්ෂා කිරීම යන අරුත් ගම්‍ය වන බවය.[12] 'අර්ථ' නමැති ඵලය මගින් පුද්ගලයාගේ මූල්‍යමය හෙවත් ආර්ථිකමය අභිගමනයට අදාළ පාර්ශ්වය පිළිබඳ වූ කථනය අර්ථවත් කරයි. එහෙත් උක්ත අර්ථද්වයටම අවිෂය වූ දේශපාලනික හෝ රාජ්‍යතාන්ත්‍රික (Political Diplomatic) අදහසක් ද මෙමගින් නිරූපණය කෙරේ. කල්යත්ම රාජ ශාස්ත්‍රය, රාජ නීතිය, නීති ශාස්ත්‍රය වැනි දේශපාලනික ප්‍රවේශයන් ද මේ යටතේ ගොනු වී තිබේ.

ඉන්දියාවේ අතිශයින්ම සමෘද්ධිමත් වූ රාජවංශයක් වූ මෞර්ය රාජවංශය බලයට පත්වෙන්නට මත්තෙන් ඉන්දියාවේ රාජ්‍ය



විචාළ 'පද්ම නන්දයන්' ප්‍රමුඛ නව නන්දයන් පරාජය කර මෞර්ය රාජ වංශයේ උත්පාදක, චන්ද්‍රගුප්තයන් වෙත රාජ්‍ය බලය ලබා ගැනීමට අවශ්‍ය වන න්‍යායාත්මක මාර්ගෝපදේශකත්වය හා නෛතික ප්‍රතිපාදන සම්පාදනය කරන ලද්දේ කෞටිල්‍යයන් විසිනි. කෞටිල්‍ය නීතිය හා රාජ්‍ය පාලනය පිළිබඳ විශාරද පඬිවරයෙකු වුවද ස්වකීය පාණ්ඩිත්‍යය හා අන්‍යෝන්‍යව බද්ධ වූ ප්‍රායෝගික දැනුමෙන් වියුක්ත වූවෙකු ලෙස ඇතැම් වියතුන් කල්පනා කළ ද අර්ථ ශාස්ත්‍රයේ අන්තර්ගතය එම දුර්මතය සපුරා ඉවතලීමට සමත් වෙයි. ''අර්ථ ශාස්ත්‍ර සාහිත්‍යයෙහි දක්නට ලැබෙන ප්‍රධානතම වූද අංග සම්පූර්ණ වූද ග්‍රන්ථය කෞටිල්‍ය **අර්ථශාස්ත්‍රයයි**. එපමණක් නොව, මේ විෂයෙහිලා මුල් ග්‍රන්ථය වශයෙන් ද ශාස්ත්‍රීය විවේචනයන් වශයෙන් ද මෙයට හිමි වී ඇත්තේ සම්භාවනීය තැනකි.''[13] යන මෙම විස්තර කථනයන්ගෙන් **අර්ථශාස්ත්‍රයට** ලැබෙන තැන ප්‍රමාණය කළ හැකිය. කෞටිල්‍යයන්ගේ **අර්ථශාස්ත්‍රය** අධිකරණ නම් වූ පරිච්ඡේද පසළොසකින් ද, ප්‍රකරණ වශයෙන් අනුකොටස් එකසිය අසූවකින් ද, ශ්ලෝක හයදහකින් ද සමන්විතය. මෙහි එන ප්‍රථම අධිකරණ පහේදී තන්ත්‍ර හෙවත් රාජ්‍යයේ අභ්‍යන්තර පරිපාලනයට අදාළ වන සිද්ධාන්ත පිළිබඳ විස්තර කිරීමට වෙන් කර ඇති අතර තදනන්තරව එන අධිකරණ අටේදී 'ආවාප' හෙවත් ස්වකීය රාජ්‍යය තදාසන්න රාජ්‍යයන් සමග සබඳතා පැවැත්විය යුතු ආකාරය පිළිබඳව දීර්ඝව කරුණු ගොනු කර තිබේ. ඉතිරි අධිකරණද්වය විවිධ කරුණු අන්තර්ගත වන සංග්‍රහයක් වශයෙන් සකස් කොට තිබේ.[14] සාමාජික, ආර්ථික, පාලන, අධිකරණ, දණ්ඩ නීතිය, නිලතල, චර පුරුෂ සේවය, ආදායම හා වියදම ආදි සර්ව සම්පූර්ණ රාජ්‍යයක්හි ක්‍රියා කළ යුතු හැම උපදේශයක්ම කෞටිල්‍ය **අර්ථශාස්ත්‍රයේ** ගැබ්ව පවතී.[15] සමස්ත අන්තර්ගතය පිළිබඳව විමසා බැලීමේදි පෙනී යන්නේ එය රචනා කිරීමේදි කෞටිල්‍යයන් විසින් ප්‍රධාන පරමාර්ථද්වයක් අපේක්ෂා කළ බවය. රාජ්‍ය පාලනය හා සම්බන්ධ කරගත් කල්හී එහි පළමුවැන්න වූ කලි රාජ්‍යය පාලනයයි. ද්විතීය පරමාර්ථය නම් විවිධාකාර අත්පත්කර ගැනීම්වලින් රාජ්‍යය පුළුල් කිරීමයි.

එනයින් සලකා බලන විට දේශීය හා විදේශීය රාජ්‍යය කටයුතු පිළිබඳ නැතහොත් දේශපාලනය හා පරිපාලනය පිළිබඳ විද්‍යාව අර්ථශාස්ත්‍ර යන්නෙහි ගැබ්ව ඇති පෘතුල අර්ථයයි.[16] මෑතකාලීන දේශපාලන හා අර්ථ ශාස්ත්‍ර විචාරකයෝ මැකියාවෙලි නම් ඉතාලි දේශපාලන විද්‍යාඥයා විසින් රචිත 'ප්‍රින්ස්' ග්‍රන්ථයත් සමග කිසියම් සැසඳීමක් කිරීමට පෙළෙඹෙති. **ලොරෙන්සෝ** නම් රජ කුමරුන්ට රටෙහි අධිපතිත්වය ලබා ගැනීමට ඉවහල් වන උපදෙස් හා උපක්‍රම **මැකියාවෙලිගේ ප්‍රින්ස්** නම් (කෘතියේදී) යම් සේ සඳහන් කළේ ද එසේම චන්ද්‍රගුප්ත මෞර්ය රජතුමාට භාරතීය පාලන තන්ත්‍රය පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා චානක්‍ය විසින් **අර්ථශාස්ත්‍රය** රචනා කරන්නට ඇතැයි තත් ග්‍රන්ථද්වය තුලනාත්මකව අධ්‍යයනය කිරීම මගින් නිගමනය කළ හැකිය.[17]

## රජු හා රාජ්‍ය දේශපාලනය සම්බන්ධයෙන් කෞටිල්‍ය ඉදිරිපත් කරන න්‍යායන්

කෞටිල්‍ය **අර්ථශාස්ත්‍රයෙන්** නිරූපිත පාලකයාත් ඔහු වටා ගොඩනගා තිබෙන න්‍යායන්, විශේෂයෙන් පාලකයකු සතු විය යුතු සුවිශේෂ ගුණාංගයන්, ඔහුගෙන් රටටත් ජනතාවටත් ඉටු විය යුතු යුතුකම් මෙන්ම ජනතාව සතු අයිතිවාසිකම් කවරේද යන්න වර්තමානයේ හා අනාගත පාලක හා පාලිතයන් අනිවාර්යයෙන් බැලිය යුතු, අධ්‍යයනය කළ යුතු වැදගත් ග්‍රන්ථයක් වනුයේ **අර්ථශාස්ත්‍රයයි**. රටක දේශපාලනය කේන්ද්‍රගත වී ඇත්තේ රජු කේන්ද්‍රකරගත් දේශපාලන පරිපාලන ජාලාවක් මතය. එම නිසා රජු හා දේශපාලන පරිපාලනය සම්බන්ධයෙන් **අර්ථශාස්ත්‍රය** දක්වන මතවාදයන් කවරේද හා ඒවා ඉන්දීය දේශපාලන න්‍යායන් සකස් කිරීම සඳහා කෙසේ හේතු වීද යන්න විමසුමකට ලක්කළ යුතුය.

කෞටිල්‍යයන්ට අනුව පාලකයා යනු ප්‍රජාව රකින්නා, ස්වාමියා, සැපය ලබා දෙන්නා හා නීතියට අනුව ක්‍රියා කරන්නාය.[18] පාලකයා වූ කලී කතාවෙහි ව්‍යක්ත භාවය, වීරත්වය, ස්මෘති ප්‍රඥාව, බුද්ධිය හා ශක්තිය, උත්කෘෂ්ඨ ගතිය,



කවුරුන් වුවත් කවර කරුණක් වුවත් පහසුවෙන් නතුකර ගැනීමේ හැකියාව, හමුදාව මෙහෙයවීමේ හැකියාව, දුෂ්චරිතයෙහි දුරාචාරයෙහි නොබැඳීම[19] වැනි කරුණුවලින් යුක්ත විය යුතුය. ඔහු පාලනයට අතිශයින් යෝග්‍ය තැනැත්තෙකු වෙයි. කෞටිල්‍ය විසින් **අර්ථශාස්ත්‍රයේ** දී නිර්දේශිත දේශපාලන දර්ශනය සදාචාර සංකල්පයෙන් මදක් වියුක්ත වූවකි. ඔහුගේ දේශපාලන නිර්ණායකයන් හැමෙකක්ම පාහේ දේශපාලන බල ව්‍යාප්තිය හා එහි ආරක්ෂාව සම්බන්ධයෙන් ගොඩනැගී පවති. මෙම ලක්ෂණයන් සැළකිල්ලට යොමු කළ බෙරිඩේල් කීත් කෞටිල්‍ය **අර්ථශාස්ත්‍රය** "භාරතීය ජීවිතයෙහි ආධ්‍යාත්මික අංශයට හාත්පසින්ම විරුද්ධ වූ ප්‍රායෝගික අංශය පිළිබඳ සවිස්තර තොරතුරු සමුදායක් ලබාදෙන ග්‍රන්ථයක් ලෙසින් හැඳින්වීමට උත්සාහ ගනියි.[20] නමුත් පාලකයන් තමන්ගේ දේශපාලන බලය ලබා ගැනීමට, එය තහවුරු කර ගැනීමට හා ව්‍යාප්ත කිරීම යන ත්‍රිවිධ අවස්ථාවන්හි දී ප්‍රයෝජනයට ගනු ලබන ප්‍රධාන මෙවලමක් වනුයේ ආගමයි. **අර්ථශාස්ත්‍රය** ලාභ ලැබීම හා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්නකි. එය රජවරුන්ගේ ප්‍රයෝජනයට අදාළ තත්හී විනා අනෙක් තත්හී ආගම හෝ යුතුකම පිළිබඳව සඳහන් නොකරයි. එසේම යටත් රාජ්‍යයක ජනප්‍රියත්වය ලබා ගැනීමට අවශ්‍ය වූ විට ද ආගම කිසියම් අයුරකින් යොදා ගනියි.[21] ඒ අනුව **අර්ථශාස්ත්‍රය** විග්‍රහා කරන්නේ රජවරුන් ලාභ ලැබීම, තම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම, හා යටත් විජිතයක ජනප්‍රියත්වය ලබා ගැනීම යන අවස්ථාවන්හී දී පමණක් ආගමට සමීප විය යුතු බවය. ආගමෙන් බැහැරව දේශපාලන දර්ශනයක් ඉන්දියානු සමාජයට හඳුන්වාදීමට තැත්කළ පළමු ග්‍රන්ථය වනුයේ කෞටිල්‍ය **අර්ථශාස්ත්‍රය** බව මෙයින් පැහැදිලි වෙයි. ශක්තිමත් නායකයෙක් බිහිකර ගැනීම කෞටිල්‍යගේ අපේක්ෂාව වූ බව මෙම කරුණු තුළින් පැහැදිලි වෙයි. විචාරක මතවාදයන් මෙසේ වුව ද සම්පූර්ණයෙන්ම කෞටිල්‍යයන් සදාචාරයෙන් බැහැර වූ බවක් නොපෙනේ. දේශපාලන විග්‍රහායේ දී ඔහු විසින් ධර්මයේ ද අවශ්‍යතාවය ඉස්මතු කර තිබේ. කෞටිල්‍යන්ට අනුව රජු විසින් කාම, ක්‍රෝධ, ලෝභ, මාන, මද හා සතුට යන සය වැදෑරුම් සතුරන් අභිබවා

සිටිය යුතුය. එසේම ඒවා ජයගත යුතුය. විද්‍යා උපදේශයෙන් රජු ප්‍රජාව හික්මවිය යුතුය. ධනය දීමෙන් ලොවට ප්‍රිය කෙනෙකු විය යුතුය. ප්‍රජාවගේ යහපත ප්‍රධාන වශයෙන් සැළකිය යුතුය. අධර්මය හා අනර්ථකාරි දේ නොකළ යුතුය.[22] යන උපදේශාත්මක විවරණයෙන් කෞටිල්‍යයන් සදාචාරය සම්බන්ධයෙන් දක්වන ආකල්පය කවරේ ද යන්න තහවුරු වේ.

දේශපාලන ව්‍යාපාරයේ වැදගත්ම පුද්ගලයා වනුයේ රජුය. ඔහුගේ කටයුතුවල ආදර්ශය මුළු රාජ්‍යයටම එකසේ බලපානු ලබයි. එමනිසා පාලකයා නිවැරදි කාර්යශූර තැනැත්තෙක් විය යුතුය. යමෙක් දුෂ්චරිතයන්ට පෙළඹෙනුයේ නිකරුණේ කාලය ගත කිරීමෙන්ය. එමනිසා කෞටිල්‍යයන් පාලකයාට නිකරුණේ සිටීමේ කාලය සීමා කර තිබේ. ඔහුගේ දර්ශනයට අනුව පාලකයාට නිදා ගැනීමට කල් දී ඇත්තේ පැය හයකටත් වඩා අඩු කාලයකි. එහිදී ඔහු පෙන්වා දෙනුයේ රජු ධෛර්ය සම්පන්නව, උත්සාහවන්තව, අනලස්සව කටයුතු කළ යුතු බවය. එසේ කරන කල ජනතාවද ඔහු අනුගමනය කරති. රජු අධෛර්යමත්ව කටයුතු කරන කල, කළබලකාරි වන විට ජනයා ද අධෛර්යමත් වෙති.[23] එසේම කළබලකාරි ද වෙති. එවිට රාජ්‍යය සතුරන් අතට පහසුවෙන් පත්වෙයි. එමනිසා පාලකයා සියලු ජනයාට ආදර්ශමත්ව පාලනය ගෙන යා යුතු බව මෙයින් අවධාරණය කරයි. රජුගේ දින චරියාවට අනුව දවස පැය අටකට බෙදාගෙන, පළමු කොටසේ දී ආරක්ෂකයන් යෙදවීම හා අයවැය සමාලෝචනය කිරීම, නාගරික හා ගැමි ජනතාවගේ කටයුතු සොයා බැලීම, .... සිය සේනාධිපතිවරයා සමග ආරක්ෂා සංවිධානය පරීක්ෂා කිරීම වැනි කටයුතු දිවා කාලයේ සිදු කළ යුතුය.[24] රජුගේ දවල් කාලය රාජ්‍ය කටයුතු වෙනුවෙන් වෙන්ව තිබූ නිසා පාලකයාට අවිවේකයක් වූ නමුත් ඔහු අතින් මහජනයා වෙනුවෙන් කළ යුතු කටයුතු නිවැරදිව සිදු වූ බවත් ඉහත කරුණුවලින් තහවුරු වෙයි. කෞටිල්‍යයන් දක්වන්නාවූ මෙම චරියාවන් හුදු මනඃකල්පිතයක් නොවන බව ප්‍රබල අධිරාජයන් වූ අශෝක වැන්නන් අනුගමනය කළ දිනචරියාවෙන් පැහැදිලි වේ.



පෙරදිග දේශපාලන චින්තනය තුළ රජු ඒකාධිපතියෙක් නොවන බව කෞටිල්‍ය ගොඩනගන දේශපාලන දර්ශනයෙන් තහවුරු වේ. අමාත්‍ය මණ්ඩලය, සේනාධිපති, අධ්‍යක්ෂක මණ්ඩලය, මෙයාදි වශයෙන් පරිපාලනයට සම්බන්ධ වූ නිලධාරි සමූහයක් රජු වටා ගොනු වී සිටිති. එනිසා ඍජු තීරණ ගැනීමේ හැකියාවක් පාලකයාට නොවුණි. පාලකයා යනු ජනතාවගේ සේවකයෙකි. ඔහු ජනතාව ආරක්ෂා කළ යුතුය. ජනතාව වෙනුවෙන් සේවය කළ යුතුය. එම සේවයට ජනතාව ඔහුට කිසියම් වේතනයක් දෙති. එය බදු ලෙසින් අර්ථකථනය කරයි. ධාන්‍යයෙන් 1/3 ක් සහ මුදලින් හා වෙනත් භාණ්ඩවලින් 1/10ක බද්දක් රජුට ගෙවිය යුතු බව කෞටිල්‍ය කියයි. එම බදු මුදල් රාජ්‍යයට ලබා දිය යුතු වන්නේ පාලකයාගේ සුඛ විහරණය සඳහා නොව, සාමාන්‍ය ජනයාගේ පොදු සේවාවන් කිරීම සඳහා මෙන්ම ඔවුන්ට මනා ආරක්ෂාවක් සළසා දීම සඳහාය. පාලකයාද තත් බදු මුදල් ගෙන ජනතාව වෙනුවෙන් කළ යුතු කාර්යයන් නියමාකාරයෙන් සිදු කළ යුතුය. එය පාලකයෙකු සතු කාර්යයක් වන්නේය. එසේම කෞටිල්‍යයන් පාලකයා, ඉන්ද්‍ර, යම ආදි දෙවිවරුන්ට සම්බන්ධ කරනුයේ දෙවිවරුන්ට ඇති කරුණාව දයාව ආදි ගුණාංගයන් පාලකයා සතු විය යුතු බවත් එම ගුණාංගයන්ගෙන් පාලකයා මහ ජනයා පාලනය කළ යුතු බවත් කියා දෙන්නටය. එයින් බැහැරවන පාලකයෙක් ඉතා ඉක්මනින් ජනතා අප්‍රසාදයට පත් වෙන බව ඔහුගේ දර්ශනයයි. මෙම කරුණුවලින් පැහැදිලි වනුයේ කෞටිල්‍යයන් සම්පූර්ණයෙන්ම දහමින් බැහැර නොවූ බවය. ධාර්මික නොවන්නෙක් ජන අප්‍රසාදයට පත්වීම අනිවාර්යයෙන් ම සිදු වන බව ඔහුගේ ද දර්ශනයයි.

කෞටිල්‍යයන් දක්වන පාලකයා විසින් ජනතාභිවෘද්ධිය සඳහා ජනාවාස පිහිටුවීම, වැව් අමුණු කරවීම, ගවයන් සඳහා තණබිම් සැලසීම, මාර්ග නිර්මාණය කිරීම, ආකර කැනීම වැනි මහජන සුහසාධන කටයුතු කළ යුතුය. එසේම දේශීය හා විදේශීය වෙළඳාම මැනවින් සංවිධානය කළ යුතු අතර මහජනයාට අහිතකරන ලාභ ඉපයීමට අවස්ථාව සළසා නොදිය යුතුය.[25]

මෙම කරුණුවලින් පෙනී යනුයේ කෞටිල්‍යයන් දක්වන පාලකයා මහජනයා වෙනුවෙන් සේවය කළ යුතු, ඒ සඳහා කැප වූවෙක් බවය. රටවැසියාගේ සකල ශුභසිද්ධිප්‍රාප්තිය සඳහා රජු පාලකයා වශයෙන් හැම ප්‍රයත්නයක්ම දැරිය යුතු බව කෞටිල්‍යගේ අදහසයි.[26] එය භාරතීය දේශපාලන ඉතිහාසය පුරාම පාහේ දක්නට ලැබුණු කරුණක් බව පසුකාලීන ඉන්දීය දේශපාලනය අධ්‍යයනය කිරීමෙන් තහවුරු වේ. කෞටිල්‍ය න්‍යායන් හුදෙක් ග්‍රන්ථයකට පමණක් සීමා නොවුණු, ප්‍රායෝගික දේශපාලන අධිකාරියේදීද ක්‍රියාත්මක වූ කරුණු බව අශෝක චරිතය හා ගුප්ත රජවරුන්ගේ චරිත දෙස බැලීමෙන් තහවුරු වෙයි.

දණ්ඩ නීතිය ක්‍රියාත්මක කිරීම අර්ථශාස්ත්‍රයේ දී පරිපාලනය සම්බන්ධයෙන් වැදගත්ම සාධකයක් ලෙස සඳහන් කර තිබේ. මුළු ලෝකයම මෙහෙය වනුයේ දණ්ඩ නීතිය මත බවත් එය ප්‍රජාව කෙරෙහි අනිවාර්යයෙන්ම මෙහෙය විය යුතු බවත් ඔහුගේ අදහස විය. මත්ස්‍ය න්‍යාය ඉදිරිපත් කරමින් කෞටිල්‍යයන් දක්වනුයේ නීතිය හා දණ්ඩනය නිවැරදිව ක්‍රියාත්මක නොවුවහොත් ලොකු මසුන් කුඩා මාළුවන් ගිලින්නාක් මෙන් බලවතා දුබලයා මර්දනය කරන බවයි.[27] එය රාජ්‍යයකට අහිතකරය. එයින් අවනීතිය රජවීම හා රාජ්‍යයේ විනාශ වීම ද විය හැකිය. එසේම දඬුවම ක්‍රියාත්මක කරන රජුගේ අභාවයේදී බලවතා දුර්වලයා ගිලගනියි.[28] එයද රාජ්‍යක පැවැත්මට හිතකර වන්නේ නැත. ප්‍රමුඛ පාලකයෙකු දුබලයන් රැසක් එකතු වී විනාශ කිරීමට සැරසේ ද ඔවුන් එම රාජ්‍යය විනාශ කෙරේ ද එය දේශපාලන ක්ෂේත්‍රයම කණපිට හරවන්නක් බව ද ඔහු පෙන්වා දෙයි. මේ කරුණු දෙක ම සැළකිල්ලට ගෙන කටයුතු කළ යුතු බව ඔහුගේ උපදේශනයයි. රාජ්‍යක යහපත් පැවැත්ම උදෙසා නීතිය නිවැරදි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම කොතරම් වැදගත් ද යන්න ඉහත කරුණු තුළින් සනාථ වෙයි. නීතිය සාධාරණ නොවුනහොත්, පාලකයාට රුචි ආකාරයෙන් එය හැසිරවීමට උත්සාහ කළහොත් අනිවාර්යයෙන් ම තත් රාජ්‍යය ඉක්මනින් විනාශය කරා යන බව ඔහුගේ අදහස වී



තිබේ. නීතිය ජනතාව වෙනුවෙන් පවතින්නකි. එයින් ජනතාව සිය ආරක්ෂාව හා හිමිකම් ආරක්ෂා කරදීම අපේක්ෂා කරයි. සිය අපේක්ෂාවන් නීතිය තුළින් ඉෂ්ට නොවේ නම් ඔවුන් නීතිය තවදුරටත් සිය කටයුතු කෙරෙහි වළංගු කර ගන්නේ නැත. ඔවුන් අයහපත් කාර්යයන්වලට නිරතුරුවම පෙළඹේ. එවිට රාජ්‍ය මර්දනය ඒ සඳහා යොමු වේ. එයින් රාජ්‍ය අප්‍රසාදයත්, දුබලයන් රැසකගේ විරෝධයක් එක්වර රාජ්‍යය වෙත එල්ලවිය හැකිය. එය රාජ්‍යයක පැවැත්මට හිතකර වන්නේ නැත. මෙම න්‍යායාත්මක දැක්ම සර්වකාලීන හා ප්‍රායෝගික වන බව ඉතිහාසය තුළ සිදු වී ඇති විප්ලව හා ජනතා නැගිටීම් තුළින් පැහැදිලි වෙයි.

රජු දේශපාලන අධිකාරිය මෙහෙය වීමේදී ඔහු සමීපයෙන් සිටින අය කෙරෙහි ඉතා සැළකිලිමත් විය යුතු බව කෞටිල්‍ය කියයි. දේශපාලනය යනු අමුතුම තැනකි. එහි ස්ථාවරත්වය රඳා පවතින්නේ බලය මතය. බලය ලබා ගැනීම සඳහා රජු වටා සිටින අය මරණය දක්වා වූ ඕනෑම දෙයක් සිදු කිරීමට ඉඩ තිබේ. එම නිසා කෞටිල්‍යයන් පෙන්වා දෙනුයේ පළමුවෙන් සිය පුතුන්ගෙන් ආරක්ෂා විය යුතු බවයි. රජු උපතේ පටන්ම සිය දරුවන්ගෙන් ආරක්ෂා විය යුතු බවත් රාජපුත්‍රයා කකුළුවන් මෙන් පියා භක්ෂණය කරන බවත් අර්ථශාස්ත්‍රයේ උගන්වයි.[29] මෙම ක්‍රියාදාමයන් ඉතිහාසය පුරාම සිදු වූ අතර රජවරු විවිධ අවස්ථාවල සිය පුතුන් අතින් මරණය නම් වූ ඉරණමට ද පත්වුණි. අජාසත් හා නන්ද පරපුර එබඳු රාජවංශයන්ය. මෙම ඓතිහාසික තත්ත්වයන් අධ්‍යයනය කිරීමෙන් කෞටිල්‍යයන් සිය දේශපාලන න්‍යාය ගොඩ නගන්නට ඇතැයි කල්පනා කළ හැකිය. මෙබඳු අවස්ථාවන්ගෙන් ගැලවීම සඳහා රජවරුන් අනුගමණය කළ යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න පෙර න්‍යායචාරීන් දක්වා ඇති මතවාදයන් දක්වමින් කෞටිල්‍යයන් කියනුයේ එබඳු නොහික්මුණු දරුවන් සිය රාජ්‍යයෙන් දුර බැහැරකට යවන ලෙසයි. එබඳු ක්‍රියාමාර්ගයක් තුළින් එම ව්‍යසනයන් වළක්වාගත හැකි බව ඔහුගේ මතයයි.[30] එයින් සිය ආරක්ෂාව සළසාගත හැකි අතර කුමරු සිය මව් පාර්ශ්වයේ ඥාතීන් සමීපයේ රඳවා තැබීමෙන් තමන්ට තවදුරටත් ආරක්ෂා

විය හැකි බව (හිෂ්ම) පෙන්වා දෙයි. සැප විඳින රාජ කුමරු ජීවත්ව සිටියත් මැරුණා හා සමාන බව කෞටිල්‍ය වැඩි දුරටත් පෙන්වා දෙයි. මෙබඳු අවස්ථා ඉන්දීය ඉතිහාසයේ මෙන්ම ශ්‍රී ලංකා ඉතිහාසය තුළ ද දක්නට ලැබුණි. රජුගේ ආත්මාරක්ෂාව සම්බන්ධයෙන් කෞටිල්‍යයන් අදහස් ගණනාවක් 21 වන අධිකාරයේ දී දක්වා තිබේ. එම කරුණු නූතනය තුළ ද පාලකයන් ක්‍රියාවට නංවන ආරක්ෂක විධි විධාන බවට පත් ව තිබේ. එහි එන සඳහනකට අනුව ගමන් බිමන් යාමේ දී විශ්වාසවන්ත පුද්ගලයන්ගේ යාන හා වාහනවල හා විශ්වාසවන්ත නාවිකයන්ගේ නැව්වලට ගොඩවිය යුතු ය.[31] පසුකාලින රජුවරු තමන්ටම වෙන්වුණු ප්‍රවාහන ජාලාවක් ක්‍රියාත්මක කළේ මේ කරුණු සැලකිල්ලට ගෙන විය හැකිය. රටේ පාලකයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් හමුදාව හා චරපුරුෂයන් බෙහෙවින් සැළකිලිමත් විය යුතුය. එය එදාට මෙන්ම අදටද එකසේ වැදගත්ය. කෞටිල්‍ය ඉදිරිපත් කරන න්‍යායන් හුදු හිතලුවන් පමණක් නොව ඒවා ප්‍රායෝගික දේශපාලන සන්දර්භයට බෙහෙවින් වැදගත් වන බව කිව යුතුය.

## රාජ්‍ය පරිපාලනය සකස් වී ඇති අයුරු

රජුට සිය රාජ්‍ය පරිපාලන කටයුතු මෙහෙය වීම සඳහා අතිශයින් ම වැදගත් වන කණ්ඩායම වනුයේ අමාත්‍ය මණ්ඩලයයි. අමාත්‍ය මණ්ඩලය පත්කර ගැනීම ඉතා කල්පනාවෙන් කළ යුතු බව කෞටිල්‍යගේ අදහසයි. විශ්වාසවන්ත, තමන් හොඳින් දන්නා කියන අය, සමීප හිතවතුන්, තමන්ට ඇල්මක් දක්වන්නන්, කාර්යශූර පිරිස්, එසේම පිරිසිදු කුලවන්තයන් මේ සඳහා තෝරාපත් කරගත යුතු ය. තමන්ගේ ඥාතීන් හිතවතුන් තමන්ගේ පරිපාලනයට බද්ධ කර ගැනීම තුළින් තත් කාර්යයන් කරලීමට හැකියාව ලැබෙන අතර රජු ඔවුන් හා ඔවුන්ගේ කාර්යයන් කවරේද යන්න දන්න නිසා ගැටලු හා ප්‍රශ්න ඇති වීම සීමා සහිත බව එයින් ගම්‍ය වෙයි. එසේම අමාත්‍ය මණ්ඩලය ද තමන් පිළිබඳව රජු දන්නා නිසා වැරදි කිරීමෙන් හා රජුට එරෙහිව යාමෙන් වැළකී සිටින්නට කල්පනා කරති. සිය පියා හෝ සීයා හෝ අමාත්‍ය මණ්ඩලයට



පත්කර ගන්නා ලෙසත් එසේ පත්කර ගත යුත්තේ ඔවුන්ගේ ප්‍රශස්ථ කාර්ය සැළකිල්ලට ගෙන බවත් **අර්ථශාස්ත්‍රය** කියයි.[32] මෙම දේශපාලන න්‍යාය පසුකාලීන ඉන්දීය දේශපාලන දර්ශනය තුළ පැහැදිලිවම දක්නට ලැබුණි. ගුප්ත රාජවංශය සම්බන්ධයෙන් මෙම තත්ත්වය වඩාත් ඉස්මතු වී තිබුණි. එම පරිපාලන සම්ප්‍රදාය ඉන්දියාවේ පමණක් නොව පෙරදිග දේශපාලන චින්තනය තුළ ද වඩාත් ක්‍රියාවට නැංවුණු අංශයක් ලෙසින් සඳහන් කළ හැකිය. එය නූතනය තුළ ද එළසින්ම ක්‍රියාත්මක වන බව සමස්ත ලෝක දේශපාලනය අධ්‍යයනය කිරීමේදී තහවුරු වෙයි. **අර්ථශාස්ත්‍රයේ** අටවන අධිකාරයේ අවසානයේ කෞටිල්‍යයන් දක්වනුයේ අමාත්‍යය මණ්ඩලය පත් කිරීමේදී සමත්කමට අනුරූපව දේශය, කුලය, කාලය හා ක්‍රියා අනුව බෙදා ඇමතිවරු පත්කර ගත යුතු බවය.[33] සමත්කම පිළිබඳව දැක්ම නූතනය තුළ කෙසේ වෙතත් පැරණි ඉන්දීය දේශපාලන චින්තනය තුළ සිදු වූ බව එරට දේශපාලන ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් තහවුරු වේ. ඇමතිවරු පත් කර ගැනීමේ දී ඔහු කුමන ලක්ෂණයන්ගෙන් සමන්විත විය යුතු ද යන වැදගත් කරුණු රැසක් **අර්ථශාස්ත්‍රයෙන්** හෙළි වේ. කුලීනයකු වීම, සංගීතය, යුද්ධය, කලාව දත් අයෙකු වීම, සේනාව මෙහෙය වීමට හැකි අයෙකු වීම, ධෛර්යවන්ත බව, නිරෝගි බව, චපල බවෙන් තොර වීම[34] ආදි ලක්ෂණ ගණනාවකින් හෙබි පුද්ගලයන් සිය අමාත්‍ය මණ්ඩලයට පත්කර ගත යුතු බව කෞටිල්‍යගේ අදහසයි. මෙම විස්තරයන්ගෙන් සිය ආමාත්‍ය මණ්ඩලය සකස් කරගත යුත්තේ කවර පුද්ගල චරිතවලින් හෙබි අයවලුන්ද යන්න පැහැදිලිය. පාලකයා කෙරෙහි විශ්වාසවන්ත චරිත මෙන්ම නිර්භීත, චරිතවත් පුද්ගලයන් සිය අමාත්‍ය මණ්ඩලය සඳහා පත්කර ගත යුතු බව කෞටිල්‍යගේ අදහස වෙයි. මෙහිදී පුද්ගලයන් සතු මුදලට වටිනාකමක් නොදී ඔහු සතු හැකියාවට, චරිතවත් බව ඇගයීමට ලක්කර තිබේ.

අමාත්‍ය මණ්ඩලය හා පුරෝහිතයන් මෙයාකාරයෙන් පත්කර ගත යුතු අතරම ඔවුන් පිළිබඳව සැළකිලිමත් විය යුතු බව කෞටිල්‍ය කියයි. මන්ද සිය රාජ සභාවේ සිටින අය වුව තමන්ට

එරෙහිව ක්‍රියාත්මක විය හැකිය. එනිසා ඔවුන් කරන්නේ මොනවාද, හැසිරෙන්නේ කෙසේ ද යන කරුණු අධ්‍යයනය කිරීම සඳහා වෙනම චරපුරුෂ සේවාවක් ක්‍රියාත්මක විය යුතු බව ඔහුගේ අදහසයි. එම කාර්යය රජු හෝ බිසව විසින් නොකළ යුතුය. විෂවලින් පිරිසිදු ජලය දූෂිත නොකළ යුතු අතර එසේ දූෂිත කළහොත් එය නැවත ප්‍රකෘතිමත් කිරීමට ඖෂධ යෙදවීම අසීරු මෙන් රජු මේ කාර්යය සැලකිල්ලෙන් කළ යුතු බවයි කෞටිල්‍යගේ අදහස වනුයේ.[35] එසේ නොමැති වුවහොත් පරිපාලනය අවුල් විය හැකිය. එනිසා පාලකයා සිය නිලධාරීන්ගේ කටයුතු සොයා බැලීම සඳහා වෙනම ඒකකයක් පවත්වාගෙන යා යුතුය. මේ කාර්යය තත්කාලයට පමණක් නොව නූතනයට ද එකසේ අදාළ වන්නකි. ඉන්දීය දේශපාලනය සකස් වීම සඳහා කෞටිල්‍යයන්ගේ මේ අදහස් කොතරම් බලපෑම් කළේ ද යන්න ගුප්ත අවධියේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. ගුප්ත රාජවංශය මෙම කටයුතු සැලකිල්ලෙන් කළ බවට බොහෝ නිදසුන් පවතී.[36]

රාජ්‍ය පරිපාලනයේදී වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබන පාර්ශ්වයක් වනුයේ රටෙහි චරපුරුෂ සේවාවයි. ඔවුන් පිළිබඳව, ඔවුන්ගේ කටයුතු සම්බන්ධයෙන් වැදගත් තොරතුරු රැසක් අධිකාර 11 අඩංගු වෙයි. පාලනයක් මනාව ගෙන යා හැකිවනුයේ අනුශාසනාව මගිනි. හිතුවක්කාර ලෙස පාලනය ගෙන යා නොහැකිය. පාලකයා කොතරම් යහපත් වුව ද ඔහුගේ අනගාමිකයන් එසේත් නොමැතිනම් ඔහුගේ සහචරයන් අයහපත් වුවහොත් එම රාජ්‍යයේ පාලනය කඩා වැටීමට ලක් වේ. රජු යහපත් වුවහොත් අනෙක් පිරිස් ද යහපත් වනු ඇත. එනිසා ප්‍රථමයෙන් පාලකයා යහපත් විය යුතුය. ඔහු පාලනය පවරා දී ඔවුන් පිළිබඳව සුපරීක්ෂාකාරී විය යුතුය. ඒ සඳහා පාලකයාට උදව් වන්නේ චරපුරුෂ සේවාවයි. ඔවුන් රජුගේ ඇස හා සමානය.[37] රජු චරපුරුෂයන් හමු විය යුතු කාලය වනුයේ රාත්‍රියේ සප්තම කොටසේ දීය. ඉන් පසුව රහස් වාර්තා කියවා අවශ්‍ය තැන්වලට චරපුරුෂයන් යෙදවිය යුතුය. රාජ්‍යයක් තුළ ක්‍රියාත්මක වන චරපුරුෂයන් කාපටික (මහජනයාගේ ගුප්ත රහස් දැනගන්නා වූ දක්ෂ ශිෂ්‍යකු වෙසින් සිටින්නා), උදාස්ථිත,



(සන්‍යාසි වේෂයෙන් සිටින බුද්ධිමත් පිවිතුරු චරපුරුෂයා) ගෘහපතික, (පිවිතුරු සිතක් ඇති, බුද්ධිමත් ධනහීන ගොවියෙකුගේ වේශයෙන් සිටින කෙනා) වෛදේහක පිවිතුරු හදක් ඇති බුද්ධිමත් ධනහීන ව්‍යාපාරයකුගේ වෙසින් සිටින්නා), තාපස, (මුඩු කළ නැතහොත් ජටායුක්ත වේශයෙන් සිටින්නා) ස්ත්‍රී, තීක්ෂණ, රසද, භික්ෂුකී යනුවෙන් වර්ග කිරීමක් කෞටිල්‍යයන් විසින් සිදු කරනු ලබයි.[38] මෙයින් ගම්‍ය වන කරුණ වනුයේ චරපුරුෂ සේවාව සඳහා ඉතා බුද්ධිමත් පිරිසක් තෝරාගෙන ඇති බවය. මෙම සේවාව ලොව ඕනෑම රාජ්‍යයකට අවශ්‍ය වන්නා වූ සේවාවකි. එමනිසා හැම රාජ්‍යයක්ම සිය චරපුරුෂ සේවාව කාර්යක්ෂමව හා සූක්ෂම අයුරින් පවත්වාගෙන යාමට උත්සාහ දරයි. මෞර්ය අවධියේ පමණක් නොව ගුප්ත අවධියේ දී චරපුරුෂ සේවාව මැනවින් ක්‍රියාත්මක වූ බව තත් අවධියේ ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වෙයි.[39] මෙම න්‍යායාත්මක ප්‍රවේශය නූතනය තුළද එකසේ ජනප්‍රිය මාතෘකාවකි. චරපුරුෂ සේවය සඳහා යොදවා ගනුයේ බොහෝ ක්ෂේත්‍රයන් පිළිබඳ දන්න කටුක අත්දැකීම්වලට මුහුණදිය හැකි පුද්ගලයන්ය. රාජ්‍යයකට අවශ්‍යම කරන ඒකකයක් ලෙස චරපුරුෂ සේවය හඳුනාගත හැකිය.

චරපුරුෂ සේවාව මගින් ලබා ගන්නා තොරතුරු හොඳින් අධ්‍යයනය කර රාජද්‍රෝහී කටයුතු කරන රාජ්‍යය නිලධාරීන් සොයා ඔවුන්ට ඉතා ඉක්මනින් දඬුවම් කළ යුතු බව කෞටිල්‍යගේ අදහසයි. රාජපාක්ෂිකභාවය සිඳලීම, ශරීර අවයව සිඳ දැමීමට තරම් බරපතල සාපරාධී ක්‍රියාවක් ය.[40] මෙයින් පෙනී යනුයේ සිය නිලධාරී සමූහයා රාජ පාක්ෂික භාවයෙන් කටයුතු කරලීම අතිශයින් වැදගත් බවය. එසේ නොවුවහොත් අවසන මරණයෙන් පවා සිය ජීවිතය තොර කර ගන්නට සිදු වන බව මේ කරුණුවලින් සනාථ වේ. නූතනයේදීද එය එසේම වන්නේය. යමෙක් රාජ්‍යද්‍රෝහී වන්නේ ද ඔහුට මරණ දණ්ඩනය පවා නියම කළ හැකිය. රාජ්‍ය පාක්ෂික බව එතරම්ම වැදගත්ය.

රාජ්‍ය පරිපාලනයේදී අතිශයින් ම වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන පාර්ශ්වය වන්නේ යුධ හමුදාවයි. එය මැනවින්

සංවිධාන කළ යුතු බව කෞටිල්‍යගේ අදහසයි. හොඳ සෙන්පතියෙක් යටතේ හමුදාව ගොනු කළ යුතු අතර රාජ්‍යයේ ආරක්‍ෂාව භාර වනුයේ ඔවුන්ටය. කෞටිල්‍ය මෙම න්‍යායන් රචනා කරන අවධියේ ඉන්දියාවේ බොහෝ රාජ්‍යයන් නිර්මාණය වූයේ යුධ හමුදාව මුල් කරගෙනය. රාජ්‍යය පුළුල් කර ගැනීම මෙන්ම රාජ්‍යය අනිකුත් සතුරන්ගෙන් ආරක්‍ෂා කරගැනීම සිදු කළේ හමුදාවයි. ක්‍රි. පූ. හයවන සියවසේ සිට ක්‍රි. ව. අටවන සියවස දක්වා එසේත් නොමැතිනම් හර්ෂ රජු දක්වා වූ කාලය තුළ ඉන්දීය රාජ්‍යයන්ගේ පැවැත්ම යුධ හමුදාව හරහා තීරණය වූ බව ඉන්දීය ඉතිහාසය සාක්ෂි සපයයි. ඊට පසුව නිර්මාණය වූ මුස්ලිම් රාජ්‍යයන්ගේ නිර්මාණය ද හමුදාව තුළින් සිදු වූ බව පැහැදිලි ලෙසම දැකගත හැකිය.

හමුදාව විශ්වාසවන්ත ප්‍රධානීන් යටතේ තැබිය යුතුය. එසේ නොමැති නම් ඔවුන් සංවිධානාත්මකව රාජ්‍යය පෙරලීමට කටයුතු කරන බව කෞටිල්‍යගේ අදහසයි. හමුදාව එවැනි තත්ත්වයකට පත්වනුයේ ඔවුන් අපහසුවට හා අසතුටට පත් වූ විටය. එමනිසා හමුදාව සතුටින් තැබීමටත් ඔවුන්ගේ අඩුපාඩු කවරේද යන්නත් අධ්‍යයනය කරමින් එයට පිළියම් කළ යුතු ය. හමුදාව පාලනයට සහය දක්වනවා සේම ඔවුන්ගෙන් ඇති වන ව්‍යසනයන් පිළිබඳව ද සැළකිලිමත් විය යුතුය. ඔවුන්ගෙන් ව්‍යසනයන් ඇති වනුයේ කුමන කරුණු නිසාද යන්න පළමුවෙන් දක්වන කෞටිල්‍යයන්, රජයෙන් ලැබිය යුතු සම්මාන ආදිය නොලැබීම, වැටුප් නොගෙවීම, සටන් බිමේ දී රෝගාබාධ වීම, අධික වෙහෙසට පත්වීම, අපේක්‍ෂා භංගත්වය, හමුදා ආවරණ ඉවත් කිරීම, නායකයා සමග සමගියෙන් කටයුතු නොකිරීම[41] යනාදි අවස්ථාවන්හීදී අසහනයට පත්වෙයි. මෙම විස්තර කථනයන් අතිශයින් ඉන්දියානු දේශපාලන න්‍යාය සකස්වීම සඳහා හේතු විය. ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ අවසාන භාගයේ යුධ හමුදාව ක්‍රියාකළ ආකාරයෙන් මේ තත්ත්වයන් තවත් උද්දීපණය වී තිබේ. අතීතයේ පමණක් නොව නූතනයේ ද පාලක පන්තිය යුධ හමුදාව සම්බන්ධයෙන් විශේෂ සැළකිල්ලක් දක්වති. ඔවුන් අත විශාල බලයක් ඒකරාශි වන



අතර ඔවුන්ට රාජ්‍යයන් පෙරලා දැමීමේ හැකියාක් නිර්මාණය වේ. එබඳු අවස්ථා ඉතිහාසයේ ඕනෑ තරම් දකින්නට ලැබේ. දකුණු ආසියාවේ පාකිස්ථානය හා බංගලාදේශය වැනි රාජ්‍යයන් ඒ සඳහා නූතනයේ කදිම නිදසුන් සපයන රාජ්‍යයන්ය.

### අධිකරණ ක්‍ෂේත්‍රය හා ආර්ථිකය පිළිබඳව කෞටිල්‍යන් ගොඩ නගා ඇති න්‍යායන්

රාජ්‍ය පරිපාලනයේ දී අතිශය වැදගත් වන සංස්ථා දෙකක් ලෙස අධිකරණ හා ආර්ථික ක්‍ෂේත්‍රයන් හැඳින්විය හැකිය. අධිකරණ ක්‍ෂේත්‍රය මගින් රටෙහි නීතිය සුරක්ෂිත කිරීමත් ආර්ථික ක්‍ෂේත්‍රය තුළින් රටෙහි සංවර්ධනයත්, සුභසිද්ධියත් අපේක්ෂිතය. එම සංස්ථා දෙක නිවැරදි අයුරින් ක්‍රියාත්මක නොවේ නම් අනිවාර්යයෙන්ම තත් රාජ්‍යය පරිහානියට පත් වේ. එම නිසාම කෞටිල්‍යන් විසින් රාජ්‍යයක් පවත්වාගෙන යාමේ දී අධිකරණ හා ආර්ථික ක්‍ෂේත්‍රයන්ට වැඩි අවධානයක් දක්වා තිබේ.

රාජ්‍යයක පවත්වාගෙන යා යුතු සුදුසුම නීතිය වනුයේ දණ්ඩ නීතියයි. මෙයින් නොලත් දෙයක් ලැබීමත් ලත් දෙයක් ආරක්‍ෂා කරන, ආරක්‍ෂා කළ දෙයක් සංවර්ධනය කරන, සංවර්ධනය කළ දෙයක් සුදුසු පුද්ගලයා වෙනුවෙන් දෙනු ලබන දෙයකි.[42] නීතිය හා දණ්ඩනය කොතරම් වැදගත් දෙයක් ද යන්න මෙයින් ගම්‍ය වෙයි. ලෝකය පවත්නේ දණ්ඩ නීතිය මතය. එමනිසා රජු උත්සාහවත්ව දණ්ඩණය ක්‍රියාත්මක කළ යුතුය. නමුත් මේ මතයෙන් මදක් ඈත්වන කෞටිල්‍යන් සත්ත්වයන්ට තියුණු දඬුවම් දීමෙන් උද්වේගයට පත්වෙන බවත්, මෘදු දඬුවම් දීමෙන් රජු අවමානයට පත්වෙන බවත් කියයි. එම නිසා පාලකයකු විසින් සුදුසු පරිදි දඬුවම් දිය යුතුය. එබඳු රජු පූජනීයත්වයට පත්වෙන අතර සුදුසු දඬුවම හා නීතිය ක්‍රියාවට නැංවීමෙන් ප්‍රජාව ධර්ම, අර්ථ හා කාමයේ යෙදවිය හැකි බව ඔහු පෙන්වා දී තිබේ.[43] 'රජු යනු නීතිය' යනුවෙන් අදහස් දක්වා ඇත්තේ ද එනිසාය. දඬුවම හා නීතිය නිවැරදි ආකාරයෙන් ක්‍රියාත්ම නොකළහොත් රාජ්‍යය තුළ 'මත්ස්‍ය න්‍යාය' පවා ඇති වන බව පෙන්වා දෙමින් පාලකයා විසින් අනිවාර්යයෙන්ම සුදුසු නිවැරදි

08 JUN 2014
පුස්තකාලය

නීතිය ක්‍රියාවට නැංවීම කළ යුතු බව අවධාරණය කරයි. එය සර්වකාලීන දේශපාලන දැක්මක් ලෙසින් අර්ථකථනය කළ හැකිය. නීතිය නිවැරදිව හැමට පොදුවේ ක්‍රියාත්මක නොවන්නේ නම් නීතිය පිළිබඳව තිබෙන විශ්වාසය ජනතාව අතුරින් ගිලිහෙන අතර, ප්‍රභූන් එය ප්‍රයෝජනයට ගෙන පොඩි මිනිසා පාගා දැමීමට කටයුතු කරයි. එය රාජ්‍යයකට එතරම් හොඳ දෙයක් නොවේ. මහජනයාගේ නැගිටීම් ඉතා ඉක්මනින් ඒ වෙනුවෙන් ඇති විය හැකිය. එවිට රාජ්‍යය පවා බිඳ වැටේ. මෙම අදහස් භාරතීය දේශපාලන න්‍යායන් සැකසීමේ දී අතිශයින් වැදගත් වූ අතර බොහෝ රාජ වංශ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරලීම සඳහා පහළම අධිකරණ පද්ධතියේ සිට උසස්ම අධිකරණය දක්වා වූ අධිකරණ පද්ධතියක් පවත්වාගෙන ගිය ආකාරය දැකීමෙන් එය සනාථ කරගත හැකිය.

භාරතීය දේශපාලන න්‍යාය තුළ වැදගත් තවත් ක්ෂේත්‍රයක් වනුයේ ආර්ථික ක්ෂේත්‍රයයි. එය කෞටිල්‍යන්ට අනුව නම් රාජ්‍ය හා එකට බද්ධ වී පවතින ක්ෂේත්‍රයකි. රාජ්‍යත් ආර්ථිකයත් කාසියක දෙපැත්ත හා සමානය. ආර්ථිකය මෙහෙය වන්නේ ද රාජ්‍යයි. රාජ්‍යය මෙහෙය වන්නේ ද ආර්ථිකයයි. මේ දෙකෙන් වෙන්ව ක්ෂේත්‍ර දෙකටම පැවැත්මක් නැත. එනිසා වෙළඳාම හා කෘෂි ආර්ථිකය කෙරෙහි වැඩි අවධානයක් සිය ග්‍රන්ථයේ දී දක්වා තිබේ. ජනතාව කළකිරෙන ජීවිතයක් උරුම කර දීමට වෙළෙන්දන්ට ඉඩ දී නැත. ඔහු ඉදිරිපත් කරන වාණිජ නීති රීති පද්ධතියෙහි සර්වකාලීන වටිනාකමක් පවතී. බඩු මිලට ගැනීමේ දී, කිරුම් මිණුම්වලදී වංචා කිරීම, කෘත්‍රිම බාල බඩු නියම සැබෑ ඒවා හැටියට සහතික කොට විකිණීම, භාණ්ඩ වැඩි මිලට විකිණීම වැනි දෑ වෙළඳ මගඩි[44] වශයෙන් දක්වන කෞටිල්‍යයන් ඔවුන්ට නිසි දඬුවම් දිය යුතු බව කියයි. මේ කාර්යයන් සොයා බැලීම සඳහා වෙනම නිලධාරි පිරිසක් (ආදායම් අධ්‍යක්ෂක) යෙදවිය යුතුය. වාණිජ අධ්‍යක්ෂක සියල්ල පිළිබඳ දත් කෙනෙක් විය යුතුය. පාරිභෝගිකයාට හෝ වෙළෙන්දා යන දෙදෙනාටම අකටයුත්තක් සිදු නොවිය යුතුය. වෙළඳාමෙන් හා කෘෂි කටයුතුවලින් ලැබෙන ආදායමෙන් හා කොටසින් රජයට ලැබිය



යුතු කොටස මේ නිලධාරින් විසින් එක්රැස් කරගත යුතුය. දේශීය නිෂ්පාදනවලින් වෙළෙන්දන්ට ලාභ ලැබිය හැකි වූයේ 5% කි. ආනයන භාණ්ඩවලින් 10% ක ලාභයක් වෙළෙන්දන්ට ලැබුණි. නියමිත ලාභයට වඩා වැඩි ලාභයක් ගෙන භාණ්ඩ විකුණන්නේ නම් එහිදී රජය මැදිහත් විය යුතුය. වෙළඳ ඒකාධිකාරයක් පවත්වාගෙන යාමට වෙළෙන්දන්ට ඉඩ නොතිබිය යුතුය. එසේම එවැනි දේ කරන්නේ නම් ඔවුන්ට සුදුසු ආකාරයෙන් දඬුවම් කළ යුතුය.[45] බඩු සඟවා භාණ්ඩ මිල ඉහළ දැමීමේ ආදි දෑ කරන්නේ නම් වෙළඳාමේ පාලනය රජය භාරගත යුතු බව කෞටිල්‍ය කියයි. අවශ්‍ය කරන භාණ්ඩ රාජ්‍ය කෝෂ්ඨාගාරයේ තැන්පත් කර වෙළඳ පොළට යොමු කිරීම රාජ්‍ය විසින් කළ යුතුය. මෙහිදී සම්පූර්ණයෙන්ම රාජ්‍ය විසින් ආර්ථිකය මෙහෙය විය යුතුය යන අදහස දරන්නේ නැත. පෞද්ගලික වෙළඳාමට අමතරව රාජ්‍ය ඒකාධිකාරය පවත්වාගෙන ගිය වෙළඳාමක් ද තිබිය යුතු ය. එය බොහෝ විට ඛනිජ සම්පත් හා රාජ්‍යයේ වටිනා සම්පත් කෙරෙහි පැවැත්විය යුතු කරුණකි. රාජ්‍යයේ ආර්ථිකය ශක්තිමත් වනුයේ බදු මුදල්වලිනි. ආදයම් කොමසාරිස්ගේ කාර්ය විය යුත්තේ රාජ්‍යයට ලැබිය යුතු එම බදු මුදල් භාණ්ඩාගාරය වෙත ලබා ගැනීමයි. ඛනිජ සම්පත් විශේෂයෙන් රත්තරන් මැණික් ආදි සම්පත් රාජ්‍යය සතු දේවල්ය. ඒවා රාජ්‍යය විසින් ආරක්ෂා කළ යුතු අතර එහි ආදායම රාජ්‍ය ලබා ගත යුතුය. මේ ඒකාධිකාරි න්‍යාය අතීතයේ සිට නූතනය දක්වා වූ රාජ්‍යයන්හී පැහැදිලිව ම දක්නට ලැබෙන කරුණක්ය. සාමාන්‍යයෙන් ආනයන භාණ්ඩ සියල්ලෙන් බද්දක් අය කළ යුතුය. එය 'ශුල්ක' ලෙසින් හඳුන්වයි. එය රාජ්‍යයේ විදේශ සංචිත සඳහා අවශ්‍ය වූ කරුණකි. මෙබඳු බදු අය කිරීම් ගණනාවක් පිළිබඳව තොරතුරු අර්ථශාස්ත්‍රයේ වෙයි. නමුත් එම බදු අයකිරීම්වලින් ජනතාව පීඩාවට පත් නොවිය යුතු බවයි එහි වැඩි දුරටත් සඳහන් වන්නේ.

රාජ්‍යයක් විසින් මහජනයා වෙත ලබා දෙන සියලු පොරොන්දු ඉටු කිරීමේ හැකියාව පවතින්නේ රජය විසින් ලබා ගන්නා බදු මතය. එම නිසා පාලකයාගේ වැඩි සැළකිල්ලක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු විය යුතුය. රටේ ආරක්ෂාව

උපරිම ආකාරයෙන් තබා ගැනීම සඳහා හමුදාව හොඳින් නඩත්තු කිරීමටත්, ජන ජීවිතය සමබරව පවත්වාගෙන යාමටත්, රාජ්‍ය භාණ්ඩාගාරය සමෘද්ධිමත් විය යුතුය. යුද්ධයක් පවතින මොහොතක වුව භාණ්ඩාගාරය හිස් නොවී පවත්වාගෙන යාමට රජු වගබලා ගත යුතුය. එබඳු අවස්ථාවක වුව මහජනයා අපහසුවට පත් නොවන අයුරින් භාණ්ඩාගාරය පුරවා ගැනීමට පාලකයා විවිධ උපක්‍රම භාවිත කළ යුතු බව කෞටිල්‍යගේ දර්ශනය වේ.[46] මෙම කරුණුවලින් පෙනී යනුයේ යුද්ධය හෝ රටේ ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා ප්‍රබල ලෙසින් ආර්ථිකය බලපාන බවය. යුද්ධයක් වැනි අවස්ථාවක දී භාණ්ඩාගාරයකට සිදු වන අලාභය පියවා ගැනීමට වෙළෙඳුන්ගෙන් අය කරගත යුතු බදු ගණනාවක් වෙයි. ඒවා අනිවාර්යයෙන් අය කරගත යුතුය. භාණ්ඩාගාරය හිස් නොවන්නට ඉඩ නොතැබීමේ තවත් වැදගත් පියවරක් වනුයේ ධනවතුන්ගෙන් ඔවුන්ගේ වත්කමේ ප්‍රමාණය අනුව ධන පරිත්‍යාගයන් ලබා ගැනීමේනි.[47] එසේම 'සීතාධ්‍යක්ෂ' නමින් අධ්‍යක්ෂකවරයෙක් පත්කොට කෘෂි කටයුතු නංවාලීමට කටයුතු කිරීමට උපදෙස් දෙයි. කෘෂි කර්මාන්තය රටක ජීවනාලිය බඳුය. යුද්ධයක් පවත්වාගෙන යාමට ආහාර අත්‍යාවශ්‍ය වෙයි. එම නිසා ඒ සඳහා වැඩි සැළකිල්ලක් රාජ්‍යයක් විසින් දැක්විය යුතු බව ඔහු විසින් පෙන්වා දී තිබේ. මෙයාකාරයෙන් ආර්ථිකය රාජ්‍යයේ දේශපාලන කටයුතු සමග බද්ධ කරලීමට කෞටිල්‍යයන් උත්සාහ ගෙන තිබේ.

### විදේශීය සබඳතා හා යුද කටයුතුවලින් නිරූපිත දේශපාලන න්‍යාය

යුධ කටයුතු හා රාජ්‍යයේ ආරක්ෂාව රඳා පවතින්නේ විදේශ සබඳතා අනුවය. සතුරු රාජ්‍යයන්ගෙන් ආරක්ෂා වීමටත්, මිත්‍ර රාජ්‍යයන් හොඳින් පවත්වා ගැනීමටත් විදේශ සබඳතා අතිශයින් වැදගත්ය. ඒ හා බැඳී පවතින අනික් කාර්ය වනුයේ යුද ක්‍රියාවලියයි. විදේශ සබඳතා ගොඩනගා ගත යුත්තේ දූත කාර්ය මගින්ය. ඔවුන් නූතනයේ තානාපතිවරු නමින් හඳුන්වයි.



කෞටිල්‍යයන් දූතයන් තුන් වර්ගයක් දක්වයි. එනම් පූර්ණ බලැති දූතයෝ, සාකච්ඡා කිරීමේ බලය පමණක් ඇති දූතයෝ, සන්දේශ ගෙන යෑමේ බලය පමණක් ඇති දූතයෝ ආදි වශයෙනි.[48] ඔවුන් ස්ථිර වශයෙන්ම විදේශීය රාජ්‍යයන්හී නවත්වා සිටින දූතයන්ය. දේශපාලන කාර්යයේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන පිරිසක් ලෙසින් මොවුන් දැක්විය හැකිය.

තානාපතිවරයා යනු රට නියෝජනය කරනු ලබන තැනැත්තාය. ඔහු යහපත් ගතිගුණවලින් හෙබි බුද්ධිමත් තැනැත්තෙක් විය යුතුය. ඔහුගේ චරිතය කවරාකාර යුතු ද යන්න දිගු විස්තරයක් කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ දැක්වේ.[49] තානාපතිවරයා නගර හා රටේ ප්‍රථම පුද්ගලයන් හා සබඳතා ගොඩනගා ගන්නට උත්සාහ ගත යුතුය. දූතයා පිටරටක සිටින විට සතුරු රජුගේ සේනා, නිවාස ස්ථාන, යුද්ධ ස්ථාන, පිටුපසට ඉවත් වීමේ ස්ථාන ආදිය නිරීක්ෂණය කළ යුතුය. එසේම සතුරු බලකොටු සංඛ්‍යාව හා රටේ විස්තරාදිය දත යුතුය. එසේම රට අභ්‍යන්තරය පිළිබඳ පූර්ණ දැනුමක් ඔහු සතුව තිබිය යුතුය.[50] හුදෙක් දූතයා යනු සංචාරකයෙක් නොවේ. ඔහු සිය රට වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කළ යුතු තැනැත්තෙක් බව මේ කරුණුවලින් ගම්‍ය වෙයි. ඔහු කොතරම් ආරක්ෂාකාරි විය යුතු ද යන්න කරුණු දක්වන කෞටිල්‍යයන් දූතයන් විසින් අනිවාර්යයෙන්ම ස්ත්‍රී ඇසුරෙන් හා මත්පැනින් දුරුවිය යුතු බවත් හුදකලාව ශයනය කළ යුතු බවත් දක්වයි. එම රාජ්‍යයේ රහස් කටයුතු තමාට අදාළ පුද්ගලයන්ගෙන් දැන ගැනීමට නොහැකි නම් යාචකයන්, මත්වූවන්ගෙන්, නත් දොඩවන්නන්ගෙන් එම තොරතුරු දැනගත යුතු බව ද සඳහන් කරයි.[51] හැකි තරම් එම රාජ්‍ය අස්ථාවර කිරීමට කටයුතු කළ යුතු අතර ඔවුනොවුන් භේද කිරීමේ කර්තව්‍ය ද වැදගත් කටයුත්තකි. මෙම කරුණු තානාපතිවරයා සම්බන්ධයෙන් කොතරම් සර්වකාලීන ද යන්න නූතන දේශපාලනය පිළිබඳව දන්නා අයට මැනවින් අවබෝධ කරගත හැකිය. මේ සියලු කාර්යයන් සිය රටෙහි ගෞරවයත් ආරක්ෂාවත් රැකගෙන සිදු කළ යුතු බව කෞටිල්‍යගේ අදහසයි.

විදේශීය රාජ්‍යයන් සමග සබඳතා ගොඩ නගා ගැනීමේ දී සන්ධි, විග්‍රහ, ආසන, යාන ආදි ක්‍රම අනුගමනය කළ යුතුය. සන්ධි යනුවෙන් අර්ථ ගැන්වෙනුයේ සාම ගිවිසුම් ඇති කර ගැනීමයි. එසේ සාම ගිවිසුම් ඇති කරගත යුත්තේ සතුරු රාජ්‍යය බලවත් වූ විටය. **විග්‍රහ** නමින් අර්ථ ගැන්වනුයේ සිය පක්‍ෂය සතුරු රාජ්‍යයට වඩා බලවත් නම් ඒ අවස්ථවේදී සටනට එළඹීමයි. **ආසන** යනු තමන්ටත් විපක්‍ෂයටත් අවැඩක් සිදු නොවැතැයි සළකා කටයුතු කිරීමයි. **යාන** යන අවස්ථාවේදී සිය බලය ශක්තිමත් නම් එසේම සිය සතුරාගේ බලය හා සැසඳීමේදී කිසියම් සාම්‍යත්වයක් වේනම් එහිදී ආක්‍රමණකාරී ක්‍රියාවලියකට[52] යා යුතු යැයි ආදි වශයෙන් හයාකාර වූ ක්‍රමවේදයන් දක්වයි. මෙහිදී අනුගමනය කළ යුතු වැදගත් න්‍යාය සංස්ථාවක් ලෙසින් මණ්ඩල න්‍යායය හඳුන්වා දෙයි. විජිගීසු කේන්ද්‍රකර ගත් මණ්ඩල න්‍යාය රජවරු දොළොස් දෙනෙකුගෙන් සමන්විත වේ. එය සතුරා → මිතුරා → සතුරාගේ මිතුරා → මිතුරාගේ මිතුරා → සතුරාගේ මිතුරාගේ සතුරා ආදි වශයෙන් මණ්ඩල න්‍යාය සකස් වී තිබේ.[53] මණ්ඩල න්‍යාය හැම කල්හිම ක්‍රියාත්මක වන්නේ ද යන්න ප්‍රශ්නකාරිය. එය එතරම් ප්‍රායෝගික නොවන්නක් බවයි පෙනී යනුයේ. හැම කල්හීම මිතුරා මිතුරු වේෂයෙනුත් සතුරා සතුරු වේෂයෙනුත් සිටීද යන්න ප්‍රශ්නකාරිය. මෙය දේශපාලන වේදිකාවට හා අධිකාරියට එතරම් ප්‍රශ්නකාරී වන්නක් නොව. ඔවුන්ගේ මිතුරු බව හා සතුරු බව සාමාන්‍ය ජනයාට අදහාගත නොහැකිය. විශ්වාස කළ නොහැකි මට්ටමක පවතී. විදේශීය ප්‍රතිපත්තියේදී මෙවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලෙස කෞටිල්‍ය දක්වයි. යුද්ධයෙනුත් සාමයෙනුත් ලැබෙන ප්‍රතිඵලය එකයිනම් යුද වැදුනාට ප්‍රශ්නයක් නොමැති බව දක්වන කෞටිල්‍ය යුද්ධයේදී මහත් විපාකයන්ට මුහුණ දීමට සිදුවන බව ද කියයි. මේ හැම කරුණකින්ම පෙනී යනුයේ රාජ්‍යයෙහි සාමය ස්ථාවරව පවත්වාගෙන යාමට කරන ලද අපේක්‍ෂාවන්ය. අනවශ්‍ය ආකාරයෙන් යුද්ධයන්ට නොඑළඹිය යුතු බව මෙයින් අදහස් කරයි.



යුද වැදීම ආවාට ගියාට කළ යුත්තක් නොවන බව කෞටිල්‍යගේ අදහසයි. පහසුවෙන් පරාජය කළ හැකි පාලකයකු සිටින විට හා නියම සතුරා සිටින විට පළමුවෙන් පහර දිය යුත්තේ නියම සතුරාට බව කියමින් යුද්ධය නියම ආකාරයෙන් මෙහෙය වීමට අනුබල දෙයි. එසේම එයින් විශාල වාසි රැසක් අත්පත් කරගත හැකි බව ද ඔහුගේ අදහසයි. මේ ආකාරයෙන් යුද ව්‍යාපාරයේ ක්‍රමෝපායන් ගණනාවක් **අර්ථශාස්ත්‍රයේ** සඳහන් කර තිබේ.[54] මෙම න්‍යාය ධර්මයන් ඉන්දීය දේශපාලන න්‍යායන් ගොඩනැගීමේ දී ප්‍රබල ලෙසින් බලපාන්නට ඇත. විදේශ ප්‍රතිපත්තියක අඩංගු විය යුතු උපායන් වන සාම, දාන, භේද, දණ්ඩ යන උපායන් ප්‍රතිවාදින් ජය ගැනීම සම්බන්ධයෙන් කල්පනාකාරිව භාවිත කළ යුතු බව ඔහුගේ අදහසයි. දුර්වල පාලකයන් සඳහා සාම හා දාන යන උපායනුත් බලවත් පාලකයන් වෙනුවෙන් භේද හා දණ්ඩ යන උපායන් ද එසේම ධර්ම විජය, ලෝභ විජය, හා අසුර විජය වැනි උපායන් ද විදේශ යුධ ප්‍රතිපත්තිය තුළ භාවිත කළ යුතු ය.[55] කෞටිල්‍යන්ගේ අදහසට අනුව රටවල් ජය ගැනීම බල ලෝභයට ආවාට ගියාට නොකළයුත්තකි. මෙම දේශපාලන න්‍යායන් කොතරම් සර්වකාලීන ද යන්න ඉහත කරුණු අධ්‍යයනය කිරීම තුළින් පැහැදිලි වෙයි. යුද්ධයකදී හිතු මනාපයට මැරීම හෝ දඬුවම් කිරීම නොකළ යුතුය. අභය දානය ඉල්ලන අයට එය දිය යුතුය.[56] යුද්ධයේ දී වුව කිසියම් සාධාරණ තත්ත්වයක් නිර්මාණය විය යුතු බව මෙයින් අදහස් කෙරේ.

කෞටිල්‍ය යනු දේශපාලන ක්ෂේත්‍රය තුළ ඉතා තියුණු මෙන්ම කපටි බුද්ධියකින් හෙබි පඬිවරයෙක් ලෙසින් අර්ථකථනය කළ හැකිය. දේශපාලන න්‍යායන් පිළිබඳව ඔහු සතු වූ සියුම් අවබෝධය කෙතරම්දැයි එතුමා විසින් රචිත **අර්ථශාස්ත්‍රයෙන්** කළඑළි බසියි. කිසියම් පාලකයෙක් රාජ්‍ය පාලනය විෂයෙහි සුපරිණත අයෙකු බවට පත් කිරීමට **අර්ථශාස්ත්‍රයෙන්** ලැබෙන්නේ මනා පිටුවහලකි. දේශපාලන නමැති සන්දර්භයේ මූලික පදනම මානව සමාජයයි. එහෙයින් දේශපාලඥයා මානව සමාජය පිළිබඳ විශේෂයෙන් සවිඥ්ඥාණික විය යුතුය.

කෞටිල්‍යගේ දේශපාලන දර්ශනය බොහෝ සෙයින් ධර්ම සංකල්පයෙන් බැහැරව ගොඩ නැගුණකි. ඔහු ආගමත් දේශපාලනයත් වෙන් වෙන් වූ සංස්ථා දෙකක් සේ සළකා කටයුතු කළේය. ආගමික සංකල්ප තුළින් දේශපාලනය කිරීම අපහසු බව අවබෝධ කරගත් ඔහු ධර්මය දේශපාලනයෙන් මදක් ඈත් කර දේශපාලනය යුධ කෝළාහල, ඝාතනය කිරීම්, වංචා සහගත ආදි ක්ෂේත්‍රයන් හා බද්ධ වූවක් බව පෙන්වා දී තිබේ. මෙම සංකල්පය ඉදිරියට ගෙන ඒම අතිශය වැදගත් වනුයේ පසු කාලීන පාලකයන් රාජ්‍යයෙන් ආගම වෙන්කරන්නට තැත් කිරීම තුළිනි. ආර්ථිකයත් රාජ්‍ය පාලනයත් එකට බද්ධ වූ ක්‍රියාවලියක් බව පෙන්වා දෙන කෞටිල්‍ය ආර්ථිකය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන මෙන් උපදෙස් දෙයි. එම නිසා රාජ්‍ය මැදිහත් වීමකින් තොරව පෞද්ගලිකව වෙළඳාම් කිරීම අනුමත කරන්නේ නැත. මෙම තත්ත්වයන් නූතන දේශපාලනයට ද අතිශයින් වැදගත්ය. කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ ඉගැන්වෙන විදේශ ප්‍රතිපත්තිය, තානාපති සේවය, යුද කටයුතු ආදි දේශපාලන න්‍යායන්, භාරතීය දේශපාන න්‍යායන් සකස් කිරීමේ දී අතිශයින් වැදගත් වූ බව මෙයින් පැහැදිලි වෙයි.

## ආන්තික සටහන්

1. Mohandas Karamachand Gandhi, *Rigvedasamhita,* (ed), Lahor: Moti Lalbanarsidass, Mandala 10, P. 45. (වර්ෂයක් සඳහන් නොවේ)
2. *දීඝනිකාය,* (තෙවන කොටස) පරි. බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය හිමි, කොළඹ: ශ්‍රී ලංකා ජනරජය මගින් ප්‍රකාශිතය, 1976, පි. 156.
3. 'ධම්මෙන පරෙ රඤ්ජතීති රාජා' *එම,* පි. 158.
4. ආරියදාස සෙනෙවිරත්න, *මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය,* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001, පි. 301. අදියර 7. ශ්ලෝක 3.
5. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, *පුරාතන භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම,* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001, පි. 89.
6. *මහාභාරතය,* (ශාන්තිපර්වය) පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2006, අධ්‍යාය 57.



7. පඤ්ඤාකිත්ති හිමි, *එම,* 2001, පි. 161.
8. කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, (අධිකාර 1 - 2) අනු., හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2003, පි. v.
9. *එම,*
10. ''මනුෂ්‍යාණාං වෘත්තිරර්ථඃ, මනුෂ්‍යවතී භූමිරිත්‍යර්ථඃ, තස්‍යාඃ - පෘථිව්‍යාඃ ලාභ පාලනොපායඃ ශාස්ත්‍රමර්ථශාස්ත්‍රමිතිඃ'' *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (තෙවැනි කොටස) අනු., හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2003, පි. 260.
11. ''පෘථිව්‍යා ලාභෙ පාලනෙ ච යාවන්ත්‍යර්ථශාස්ත්‍රාණි ... අර්ථශාස්ත්‍රං කෘතම්.'' *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (අධිකාර 1 - 2), 2003, පි. 1.
12. ඒ. එස්. අල්ටේකාර්, *පැරණි ඉන්දියාවේ රාජ්‍ය සහ ආණ්ඩුව,* පරි. ඩී. ඇල්. අබේරත්න, නුගේගොඩ: සමන් ප්‍රකාශකයෝ, 2004, පි. 5.
13. ජයදේව තිලකසිරි, *සංස්කෘත කාව්‍ය සාහිත්‍යය,* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1999, පි. 223.
14. *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (අධිකාර 1 - 2) 2003, පි. vi.
15. එස්. එෆ්. ද සිල්වා, ''චාණක්‍ය බමුණහුගේ අර්ථ ශාස්ත්‍රය'' *ලංකා අධ්‍යාපන සඟරාව,* (17 වන කාණ්ඩය 6 වන කලාපය) කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1960, පි. 117.
16. එච්. ජී. වාල්ස්, *කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍ර සාරය,* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1999, පි. vi.
17. තිලකසිරි, *එම,* 1999, පි. 226.
18. පඤ්ඤාකිත්ති හිමි, *එම,* 2001, පි. 162.
19. වාල්ස්, *එම,* 1999, පි. 49.
20. බෙරිඩේල් කීත්, *සංස්කෘත සාහිත්‍යය ඉතිහාසය,* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1965, පි. 686.
21. *එම,* පි. 685.
22. ''තස්මාදරසඩ්, වර්ගීත්‍යාගෙනෙන්ද්‍රියජයං කර්වීත ...'' *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (අධිකාර 1 - 2) 2003, පි. 39. අධිකාර 7.
23. ''රාජානමුත්ථිතමනුතිෂ්ඨන්තෙ භෘත්‍යාඃ- ප්‍රමාද්‍යන්තමනුප්‍රමාද්‍යන්ති ...'' *එම.* පි. 103. අධිකාර 19.

24. මංගල ඉලංගසිංහ, *පෙරදිග දේශපාලන චින්තනය,* මහනුවර: ආර්ය පොත්හල (පුද්) සමාගම, 2002, පි. 20.

25. වාල්ස්, *එම,* 1999, පි. 19.

26. ''ප්‍රජා සුඛෙ සුඛං රාඥඃ ප්‍රජානාං ච හිතෙහිතම් - නාත්මප්‍රියං හිතං රාඥඃ ප්‍රජානාං තු ප්‍රියං හිතම්'' (රටවැසියාගේ සැපත රජුගේ සැපත වෙයි. රටවැසියාගේ ශුභ සිද්ධිය රජුගේ ශුභසිද්ධිය වෙයි. තමාට ප්‍රිය වූව රජුගේ හිත සුව පිණිස නොවේ. එහෙත් ප්‍රජාවට ප්‍රිය වූව රජුගේ හිත සුව පිණිසය) *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (අධිකාර 1 - 2) 2003, පි. 104. අධිකාර 19. ශ්ලෝකය 34.

27. ''අප්‍රණීතස්තු මාත්ස්‍යාන්‍යායමුද්භාවයති'' (නුසුදුසු ලෙස දෙන දඬුවම (ලෝකයේ) මාත්ස්‍යන්‍යාය උපදවයි.'' *එම,* පි. 28. අධිකාර 4. පාඨය 13.

28. ''වලීයානබලං ග්‍රසතෙ දණ්ඩධරාභාවෙ'' *එම,* පාඨය 14.

29. ''කර්කටකසධර්මාණො හි ජනකභක්‍ෂා රාජපුත්‍රාඃ'' *එම,* පි. 91. අධිකාර 17. පාඨය 05.

30. ''තස්මාත්ස්වවිෂයාදපකෘෂ්ටෙ සාමන්තදුගෙ වාසඃ ශ්‍රෙයාන් ඉති'' ''ජීවන්මරණමෙතදිති කෞටිල්‍යඃ'' *එම,* පිටු. 91 - 92. අධිකාර 17. පාඨ 14 - 22.

31. ''ආප්තපුරුෂාධිෂ්ඨිතං යානවාහනමාරොහෙත් නාවං චාප්තනාවිකාධිෂ්ඨිතාම්'' *එම,* පි. 114. අධිකාර 21. පාඨය 18.

32. ''පිතෘපෛතාමහානමාත්‍යාන්කුර්වීත, දෘෂ්ටාවදානත්වාත්'' *එම,* පි. 43. අධිකාර 8. පාඨය 16.

33. ''විභජ්‍යාමාත්‍යවිභවං දෙශකාලෞ ච කර්ම ච - අමාත්‍යාඃ සර්ව එවෛතෙ කාර්යාඃ ස්‍යුර්න තු මන්ත්‍රිණඃ'' *එම,* පි. 43. අධිකාර 8. ශ්ලෝකය 29.

34. *එම,* පි. 47. අධිකාර 9. පළමු පාඨය.

35. ''න දූෂණමදුෂ්ටස්‍ය විෂෙණෙවාම්භසශ්චරෙත ...'' ''නෘතා ච කලුෂා බුද්ධිරුපධාභිශ්චතුර්විධා ...'' *එම,* පි. 54. අධිකාර 10. පාඨ 18 - 19.

36. ශ්‍රී වාසුදේව උපාධ්‍යාය ශුරින්, *ගුප්ත අධිරාජ්‍යයේ ඉතිහාසය,* පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1994, පි. 200.

37. පඤ්ඤාකිත්ති හිමි, *එම,* 2001, පි. 170.



38. ''උපධාභිඃ ශුද්ධාමාත්‍යවර්ගො ගූඪපුරුෂානුත්පාදයෙත කාපටිකො දාස්ථිතගෘහපති වෛදෙහකතාපසව්‍යඤ්ජනාන් සත්ත්‍රිතීක්ෂ්ණ රසදභික්ෂුකීකශ්ච.'' *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (අධිකාර 1 - 2) 2003, පි. 55. අධිකාර 11. පාඨය 01.

39. ශ්‍රී වාසුදේව උපාධ්‍යාය, *එම,* 1994, පි. 198.

40. වාල්ස්, *එම,* 1999, පි. 63.

41. ''බලව්‍යසනානි - අමානිතං, විමානිතම්, අභෘතං ... භින්නකූටම්, අන්ධම් ඉති'' *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (තෙවැනි කොටස) 2003, පි. 36. අධ්‍යාය 5. පාඨය 01.

42. *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (අධිකාර 1 - 2) 2003, පි. 29 -31. අධිකාර 4.

43. *එම,* පාඨ 8 -9 -10.

44. වාල්ස්, *එම,* 1999, පි. 93.

45. *එම,* පි. 94.

46. *එම,* පි. 101.

47. *එම,* පි. 103.

48. *එම,* පි. 75.

49. *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (අධිකාර 1 - 2) 2003, පි. 87. අධිකාර 16.

50 *එම,* පාඨ 8 -9.

51. *එම,* පි. 89. අධිකාර 16.

53. *එම,* පි. 77.

54. *එම,* පි. 81.

55. *එම,*

56. *කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* (තෙවන කොටස) 2003, පි. 170 - 172. ප්‍රකරණ 164.